Copyrighted Material

කේ. ලයනල් පෙරේරා

# අවිගත් මලකඳ

## සහ තවත් කතා

MusesBooks®

කේ. ලයනල් පෙරේරා
විසින් රචිත විද්‍යා ප්‍රබන්ධ කෘති එකතුව - 02

MusesBooks

www.musesbooks.com

Copyrighted Material

# පෙළගැස්ම

- **පළමු කතාංගය**

  අඟහරු ලොවෙන් ආ මිනිහා

- **දෙවැනි කතාංගය**

  අවිගත් මළකඳ

- **තෙවැනි කතාංගය**

  දෙකඩ වුණු මිනිහා

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# අඟහරු ලොවෙන් ආ මිනිහා



කේ. ලයනල් පෙරේරා

www.musesbooks.com

Copyrighted Material

# 1 පරිච්ඡේදය

ලංකා අපරාධ ඉතිහාසයේ එවැනි සිද්ධියක් නම් කවදාවත් නොවීය. එය අන් අපරාධ සියල්ල අබිබවා මහජනයාගේ සැලකිල්ලට විශේෂයෙන්ම භාජන වූයේ, රජයේ ඇමතිවරයෙකු ඊට ගැවුණු හෙයිනි.

ඇමතිවරයා එයට ගැවුණා යයි කීම එක් අතකින් වැරදිය. මක්නිසාද යත්, අපරාධයට භාජන වුණේ ආගමික කටයුතු භාර මේ ඇමතිවරයා හෙයිනි. ඔහුගේ අතුරුදන්වීම මුළු ලංකාවේම මහත් ආන්දෝලනයක් ඇති කෙළේය.

ලංකා පාර්ලිමේන්තුවේ ඇමති මණ්ඩලය අතර බොහෝ සෙයින්ම කැපීපෙනුණේ ආගමික කටයුතු භාර ඇමති තැන්පත් මේ සුනිල් හේවා මැතිතුමාය. ඔහු සෑම ආගමකම උන්නතිය වෙනුවෙන් එක වාගේම කටයුතු කෙළේය. ආගම යනු මිනිසුන් භේද කොට තබන ධර්ම විශේෂයක් නොව, මිනිහා සුමගට යැවීමේ උත්තරීතර න්‍යායක් බව සැලකූ සුනිල් හේවා මහතා මෙය බෞද්ධ රජයක් හැටියටවත්, එහෙයින් බෞද්ධයන්ටම සෑම පහසුවක්ම සැලසිය යුතු හැටියටවත් කවදාවත් තීරණය නොකෙළේය. බෞද්ධ සිද්ධස්ථානවලට මෙන් කතෝලික පූජ්‍යස්ථානවලටද හින්දු, මුස්ලිම් ආදි පූජ්‍යස්ථානවලටද ඔහු රජයේ අනුග්‍රහය නොමසුරුව ලබා දුන්නේය. ආගම් භේද, ජාති භේදවලින් නොයෙක් ලෙසින් ඔවුනොවුන් කෙරෙන් වෙන්වුණු ලක්වැසි ජනතාව මේ නිසාම යළිත් නොදැනුවත්වම වගේ සම්බන්ධ විය. ළංවිය. එය රජයට ලොකු පහසුවක්ද විය. ඒ පහසුවට මුල් වූයේ මේ දූරදර්ශී ඇමතිවරයා හෙයින්, ඔහු ඇමති මඬුල්ල අතර පමණක් නොව ලංකාවාසී ජනතාව අතරද බෙහෙවින්ම ජනප්‍රිය විය.

සුනිල් හේවා මහතා ව්‍යක්ත කථිකයෙක්ද විය. ශ්‍රවණය කරන්නන් දැපනේලාගෙන පැය ගණනක් වුවද කතා කිරීමේ

Copyrighted Material



හැකියාව ඔහුට තිබිණි. තම අදහස් නිරවුල් ලෙස පළකරන්නටත්, ඒ අදහස්වලට පොදු ජනයා නවාගන්නටත් හැකි බලය ඔහු වෙත නොමඳව තිබිණි. දේශපාලනඥයෙකුට එවැනි බලයක් ලැබෙන්නේ කලාතුරකිනි. කථිකත්වයෙන් වරප්‍රසාදලත් බොහෝ දේශපාලනඥයෝ ක්‍රියාවෙන් ජනප්‍රිය නොවෙති. ක්‍රියාවෙන් ජනප්‍රිය වූවෝ කථිකත්වයෙන් දුර්වල වෙති. එහෙත් සුනිල් හේවා මහතා මේ දෙකෙන්ම අගතැන්පත් විය. ඔහු මහජනයා අතර කැපීපෙනුණේත්, ඔවුන්ගේ ආදර ගෞරවයට පත්වුණේත් එහෙයිනි.

අභයගිරිය ප්‍රකෘතිමත් කරනු සඳහා මුල්ගල තැබීමේ උත්සවයට සහභාගි වනු පිණිස සුනිල් හේවා මහතා එදා කොළඹින් පිටත්වූයේ රාත්‍රි එකටය. උදේ අටට යෙදෙන ශුභ මුහුර්තයෙන් මුල්ගල තැබිය යුතු බැවින්, කල්වේලා නොඉක්මවනු පිණිස ඔහු එදා රාත්‍රි එකට මෙසේ කොළඹින් පිටත්විය. පෙරදින සවස කොළඹින් පිටත්ව රාත්‍රි අනුරාධපුර තානායමේ නැවතී මෙයට සහභාගිවීමට ඔහු මුලදී බලාපොරොත්තු වූ නුමුත්, රජයේ වැදගත් කටයුත්තක් වෙනුවෙන් පෙරදින සවස කොළඹ නැවතීමට යෙදුණු බැවින් මෙසේ අලුයම පිටත්වන්නට සුනිල් හේවා මහතාට සිදුවිය.

කුරුණෑගලදී ඔහුගේ රියදුරා අදිසියේම අසනීප විය. හිටිගමන් මෝටර් රථය නැවැත්වූ රියදුරා, තමාට බලවත් පපුවේ අමාරුවක් දැනෙන බව පවසා සුක්කානමට හිස තබා ගත්තේය. සුනිල් හේවා මහතා රථයෙන් බැස සිය රියදුරා සිටි අසුන වෙතට ගොස් ඔහුට කතා කළ මුත්, රියදුරු තෙම විසංඥවම සිටියේය. එවෙලේ එතැනට එකතුවුණු කීපදෙනාගේද සහාය ඇතිව රියැදුරු කුරුණෑගල රෝහලට භාරදුන් ඇමතිවරයා, එනගමන් මේ හිතවත් සේවකයා කොළඹට කැඳවාගෙන යාමේ බලාපොරොත්තුවෙන් රෝහලෙන් පිටවිය.

සිය රියදුරා අදිසියේම අසනීප වුණෙන් එතැන් සිට මෝටර් රථය පැදවූයේ සුනිල් හේවා මහතාමය. අලුයම තුනට එතැනින් පිටත්වුණු මේ ඇමතිවරයා, හරියට පාන්දර හතරට දඹුල්ලේ තානායමට පැමිණ විනාඩි දහයක් ගතකෙළේය. එතැනදී කෝපි කෝප්පයක් බී සිගරැට් පැකැට්ටුවක්ද මිලදී ගත් ඇමතිවරයා, හරියට හතරයි කාලට තානායමෙන් පිටවිය.

ලංකා පාර්ලිමේන්තුවේ ආගමික කටයුතු භාර ඇමති තැන්පත්, සුනිල් හේවා මහතා ගැන එයින් එහා යමක් කීමට කිසිවෙකුට

Copyrighted Material



නොහැකි විය. ඔහු ගමන් කළ දැවැන්ත රථය ගැනවත්, එහි සිටි මේ පරහිතකාමී ජන නායකයා ගැනවත් එතැනින් එහා පවසන්නට පොලිසියටවත්, රහස් පොලිසියටවත් නොහැකි විය.

සුනිල් හේවා මහතා නිරුපද්‍රිතව සිටියා නම්, උදය හය වන විට කැකිරාවටද, හයහමාර වන විට මරදන්කඩවලටද පැමිණිය යුතුය. ඔහු මරදන්කඩවල ආසනයේ මන්ත්‍රීවරයාද බැවින් උදෑසන හෝ එහි පැමිණියා නම් ඒ වෙලාවේ හැටියට ගරු සහිතව කා අතිනුත් පිළිගැනෙණු ඇත. එහෙත් ඔහු මරදන්කඩවලට තබා කැකිරාවටවත් ළංවුණු බවට කිසිම සලකුණක් නොවීය. එසේ නම් මේ ඇමතිවරයාට කුමක් සිදුවීද?

මුළු ලංකාවම මේ ප්‍රශ්නයට පිළිතුරු සෙව් නුමුත් ඒ ගැන කිසිවක් පවසන්නට කවුරුත් අපොහොසත් විය. මේ ඇමතිවරයා කෙසේවෙතත් ඔහුගේ දැවැන්ත මෝටර් රථය ගැනවත් හෝඩුවාවක් දැනගැනීම, දාගිය හේනක පුළුන් ටිකක් සෙවීම මෙන් දුෂ්කර විය.

'බැබිලන්' වර්ගයේ මේ මෝටර් රථය ලෙහෙසියෙන් සඟවා තබන්ට පුළුවන් වස්තුවක්ද නොවේ. කොටස්වලට ගැලෙව්වත් එය ලෙහෙසියෙන් වසන් කළ නොහැක. එය එතරම් විශාල, බරපතළ වාහනයකි. එහෙත් ඒ දැවැන්ත වාහනයත්, එය පැදවූ ඇමතිවරයාත් කෙසේ හෝ අතුරුදන් විය!

තව තවත් මේ ගැන සොයන පොලිසියට දින දෙකකට පසු මේ බැබිලන් රථය ගැන හෝඩුවාවක් දැනගත හැකි විය. ඒ දැනගන්නට ලැබුණේද මඩාටුගම පළාතේ ගැමියෙකුගේ මාර්ගයෙනි.

මේ ගැමියා පෙර කී සිද්ධියට දින තුනකට පසු යම්කිසි ගමනක් යද්දී අදිසියේම වන ළැහැබින් අමුතු සුවඳක් දැනී නැවතුණේය. එවෙලේ පැවැති තද සුළඟ නිසා නොවේ නම් මේ අමුතු සුවඳ ඔහුට දැනෙන්නේද නැති. කැලය පීරාගෙන ආ මේ බලවත් සුවඳ නිසා කුතුහලයට පත් ගැමියා මෙසේ මඳක් නැවතී ඒ සුවඳ එන දෙසටම පා නැඟුවේය. ටික දුරක් යන්නට පෙර ඔහුට තණකොළ ගොඩේ ගිය මෝටර් රථයක ටයර් සලකුණු දිස්විය. පාරෙන් ඉවතට ගිය මෝටර් රථය පාරේ පසෙක වූ පඳුරු සහිත කැලය පීරාගෙන ඉදිරියටම ගොස් තිබෙන හැටි ගැමියා සලකාගත්තේය. යාර පහළොවක් තරම වනයට වැදුණ රථයේ ටයර් සලකුණු හිටිගමන් අවසන් වී තිබිණි. ඒ අවසන් වුණු තැන පුදුම විදියේ අළු වර්ගයක් විය. සුවඳ දැනුණේ මේ අළුවලිනි.

Copyrighted Material



අළු වර්ගය තිබුණේ එක ගොඩකට නොවේ. අඩි 10ක් පමණ දිගින්ද, අඩි හයක් පමණ පළලින්ද යුත් පෙදෙසක් මේ අළුවලින් වැසී තිබිණි. මහත් ඕනෑකමින් කළ වැඩක් මෙන් මේ අළු ඉහත කී ඍජුකෝණාස්‍රයේ තැන්පත් වී තිබිණි. ඒ හැර වෙන කිසිම ලකුණක් එහි නොවීය.

මේ පුදුම අළුගොඩ ගැන ඔහු එවෙලේම ගම්මුලාදෑනි තැනට විස්තර කළේය. එය සියැසින් දුටු ගම්පති තැන ඒ පෙදෙසම, කිසිවෙකුටවත් ළංවන්නට ඉඩ නොසැලසෙන පරිදි වටකොට මුරකරුවන්ද දමා, වහා කැකිරාවේ පොලිසියට පණිවුඩයක් යැව්වේය. කැකිරාවේ පොලිසිය එවෙලේම කොළඹට පණිවිඩ යැව්වෙන් පැය තුනක් ගතවෙන්නට පෙර විශේෂ පරීක්ෂකවරුන් කීපදෙනෙක් එතැනට එවන ලදි.

මෝටර් රථයෙන් තැබුණු ටයර් සලකුණුවලින්, අළු පරීක්ෂා කිරීමෙන්ද, පසෙකට වීසිවී තිබුණු කණ්ණාඩි කුට්ටමකින්ද, මේ නම් අනුමානයක් නැතිවම සුනිල් හේවා මහතාගේ රථයේ අළු බව තීරණය කරන ලදි. සුනිල් හේවා මැතිනිය සිය සැමියා පාවිච්චි කළ කණ්ණාඩි කුට්ටම පහසුවෙන්ම හැඳිනගැනීම නිසා, මේ ජන නායකයා යම් කිසිවෙකුගේ මර උගුලකට අසුවී තිබෙන බව අවසාන වශයෙන් තීරණය කරන ලදි.

එහෙත් මේ අන්දමට මේ මහා රථය අළු බවට පත්කරන ලද්දේ කෙසේද යනු කාගේත් විමතියට හේතු විය. කිසිම හෝඩුවාවක් ඉතිරි නොවන්නට, අළු බිඳකුදු එහා මෙහා නොසෙල්වෙන්ට මේ රථය දවන ලද්දේ කෙසේද? එහි සිටි ඇමතිවරයාට කුමක් සිදුවීද?

ඉන්ස්පැක්ටර් ජයනාමගේ මොළය කැවෙන්ට වූයේ මේ ප්‍රශ්නවලට උත්තර සපයාගත නොහැකිකමෙනි. මේ භයානක සිද්ධිය ගැන පරීක්ෂා කිරීම සඳහා අගමැතිවරයා විසින්ම මේ නිලධාරියා පත්කරන ලද්දේ, කලින්ද මෙවැනි ගුප්ත මිනීමැරුම් කීපයක්ම මේ නිලධාරි තැන අතින් අනාවරණය වූ හෙයිනි. එංගලන්තයේ 'ස්කොට්ලන්ට් යාඩ්' සේවයේ අවුරුදු තුනක පුහුණුව ලත් ජයනාම මහතා, සිය රටට පා තැබූ පසු මෙබඳු රහස් මිනීමැරුම් කීපයක්ම පරීක්ෂා කර එළිදරව්ද කොට, පැසසුම්වලට ලක්වූයේය. කොතෙක් හපන්කම් කළද මෙදා නම් තමා පත්ව සිටින්නේ ලෙහෙසි පහසු මිනිසෙකු අතට නොවන බව රථයේ අළු ටික දුටුගමන් ජයනාම මහතා සලකාගත්තේය. අයෝමය රථයක් සුවඳ වත්සුණු වැනි

www.musesbooks.com

Copyrighted Material



අළු ගොඩකට පත්කළ මේ මිනීමරුවා ඉතා සියුම් කල්පනාකාරයෙකු බවත්, කිසිම සැකයකට ඉඩ නොතබා මේ වැඩය කර තිබෙන බවත් ඔහු වැඩිදුරටත් තීරණය කරගත්තේය.

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# වේගත් මළකඳ



www.musesbooks.com

Copyrighted Material

# 1 පරිච්ඡේදය

එය පුදුම මිනීමැරුම් නඩුවකි. එහෙත් එවැනි මිනීමැරුම් නඩු මුළු ලෝකයේම විටින් විට ඇතිවේ. නිකරුණේ අසරණ මිනිසුන් එල්ලුම්ගස් යන අවස්ථා මෙන්ම, පෙනි පෙනී මිනී මරලාත් සාක්කි නැතිකමින්, නැතිනම් ධන බලයෙන් නොහොත් මැරවර බලයෙන් මිනීමරුවන් නීතියේ රැහැනට අසු නොවූ අවස්ථා ගැනද ලෝකයේ නොයෙක් රටවලින් වරින්වර දැනගන්නට ලැබේ.

දොස්තර අනිල් රණවීරට මුහුණපාන්නට වූ මිනීමැරුම් නඩුවද පෙර කී පළමු උදාහරණයට ගැනුණු අතිශය දුඃඛිත එකකි. ඔහු මළමිනී කපන්නටත්, ඒ මළකුණුවල ආධාරයෙන් නොයෙකුත් පර්යේෂණ පවත්වා මනුෂ්‍ය වර්ගයාට අතිශයින්ම ප්‍රයෝජනවත් වූ කරුණු සොයා මහජන සේවයේ යෙදෙන්නටත් උපන් මිනිහෙක් විනා, මිනීමරන්නටවත්, එවැනි චෝදනාවක් හිස මත ඇතිව අධිකරණයට මුහුණපාන්නටවත් උපන් මිනිහෙකු නම් නොවේ. එහෙත් ඔහු මිනීමැරුම් නඩුවකට පැටලුණේය. අභාග්‍යයක හැටි! අසරණ අනිල් රණවීර ඒ පැටලුණේද නිකම්ම නොවේ. තමාට අතිශයින්ම අහිතවත් වූ, අපක්ෂ වූ සාක්කි රැසකුත් ඇතිවය.

දොස්තර අනිල් රණවීර පුදුම මිනිහෙකි. සුඛෝපභෝගී ජීවිතයට ගැවුණු දහස් ගණන් දොස්තරවරුන් අතරින් පමණක් නොව, සාමාන්‍ය තරුණයින් අතරෙනුදු ඔහු වැනි නිහතමානි කෙනෙකු දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. ඔහුට ඕනෑ පදම් මුදල් හදල් හා ඉඩකඩම් තිබුණේය. ඒවා ඔහුට පෙර පිනෙන් ලැබුණ බව ඇතැමෙක් කීහ. වෘත්තියේ අනුහසින් ඒවා ලත් බව තවත් අය කීහ. ලැබුණේ පෙර පින නිසා හෝ වේවා, වෘත්තිය නිසා හෝ වේවා, ඔහු ඒ ධනයෙන් කවදාවත් හිස උදුම්මාගත්තේ නම් නැති. ගිනිගන්නා

Copyrighted Material



දොස්තරවරුන් අතර, ගිනි රස්නෙන් නළියන දොස්තරවරුන් අතර, ඔහු හිම කැටියක් මෙන් සිසිල් විය. ඒ සිසිල කොතරම් වීද යත්, ඇතැම් දුප්පත් රෝගීන්ගෙන් ඔහු මුදල් අය නොකළා පමණක් නොව, ඔවුන්ගේ බෙහෙත් වෙනුවෙන්ද නොයෙක් විට ඔහු මුදල් වියදම් කළේය.

ඔහු තම මිතුරන් හා කුලුපගයන් අතර ප්‍රසිද්ධ වුණේ 'කළුකුමාරයා' යනුවෙනි. දොස්තර අනිල් රණවීර එපමණටම කළුය. එමෙන්ම තරබාරුය. දැන් ඔහුට වයස විසි අටක් වුවද බැලූ බැල්මට නම් කෙනෙකුට ඔහු පෙනෙන්නේ හතළිහකටද කිට්ටු කළ කෙනෙකු හැටියටය. අඟපසඟින් ඔහු එපමණටම පරිපූර්ණය. දොස්තර අනිල් රණවීර හැඩිදැඩි දඩබ්බර මිනිසෙකු ලෙස මේ නිසාම පෙනුණද, එවැනි දඩබ්බරකමක් නම් ඔහුගේ අහලින්වත් ගෑවිලා නැති. ඔහු කරුණාවන්තය, තැන්පත්ය. එහෙත් අයුත්තේදී ඔහු විදුලි බොයිලේරුවක් මෙන් මොහොතෙන් රත්වෙන්නේය.

දොස්තර අනිල් රණවීර වෙදකමට වඩා ප්‍රිය කෙළේ ඒ පිළිබඳ පර්යේෂණවලටය. එහෙත් තමාට අත්වාසියද තිබෙන බැවින්, එයින්ද පල ගත යුතුයයි සිතූ ඔහු, රෝගීන්ට වෙදකම් කිරීමෙහිද යෙදුණේය. එසේ වුවද ඉඩකඩ ලත් සැටියේ ඔහු කෙළේ සිය සේවක ජෝන් සිල්වා සමඟ පරීක්ෂණාගාරයට වී මිනිස් සිරුර හා ජීවිතය පිළිබඳ නානාවිධ පර්යේෂණවල යෙදීමය.

ජෝන් සිල්වාද මේ දොස්තරටම හරිගිය මිනිහෙකැයි බොහෝ දෙනා කීහ. නමින් නම් ගොරහැඩි බවක් හා නිකම් නූගත් බවක් දැක්වුණද, ජෝන් සිල්වාද ඔහේ හිතුණ පලියට අහක දැමිය යුතු තරුණයෙක් නොවේ. ඔහු සෑහෙනදුරට ඉංගිරීසි උගත්, තැනට සරිලන යමක් කරන්නට මොළය ඇති නැණවත් තරුණයෙකි. රක්ෂාවක් සොයාගෙන පිටිසරින් කොළඹට ආ ඔහු, අන්තිමේදී කඩයක වේටර්කමක්වත් නොලැබ කොළඹ රස්තියාදු වුණේය. කුසට ආහාරයකුදු නැතිව එසේ ඉබාගාතේ ගිය ඔහු, එක් රැයක් කොළඹ වෝඩ් පාරේ සිහි නැතිව ඇදවැටිණි. එවෙලේ එතැන පසුකළ දොස්තර මේ තරුණයා දැක, සිය රථයේ ලාගෙන තම බංගලාවට ගෙනගියේය. එහිදී කරන ලද ප්‍රතිකාරවලින් සිහි ලත් ඔහු සාත්තු සප්පායම් ලැබුණාට පසු තම කතා පුවත නොසඟවා හෙළිකරන්ට මැළි නොවීය. එයින් කනගාටුවට පත් දොස්තර අනිල් රණවීර, මේ තරුණයාගේ උගත්කම හා නැතිබැරිකම් සලකා තම පරීක්ෂණාගාරයේ අත් උදව්වට යොදාගත්තේය.

Copyrighted Material



මුල පටන් වෛද්‍ය විද්‍යාව ඔස්සේ ගිය කෙනෙකු නොවූවද, දොස්තර රණවීරගේ අනගි මඟපෙන්වීම නිසා ජෝන් සිල්වාද ඒ මේ කියන කලියෙන් දක්ෂයකු වුණේය. බලා සිටියදීම වාගේ විජ්ජාකාරයකු අතින් පැළවෙන අඹ ගෙඩියක් මෙන්, ඔහුද ඒ අත බලා මේ අත බලන කලියෙන් මිනිස් සිරුර හා එහි නානාවිධ අවයව ගැනත්, ඒවා ක්‍රියාකරන සැටිත්, ක්‍රියාකිරීම නැවතීමට ඇති නානාවිධ හේතුත් ඉගෙනගත්තේය. මුළු කරදිය වළල්ල කලඹලාවත් මෙහෙම උදව්කාරයෙකු නම් තවත් ඉතින් සෙවිය නොහැකි යයි මේ තරුණ දොස්තරට හිතෙන තැනට ජෝන් සිල්වා සිය හාම්පුතාට නොයෙක් විට තම අගය පෙන්වීය.

ඔවුන් දෙදෙනාම තරුණයන් වීම, අඹු-දරු බැම්මෙන් ඈත්වුණ අය වීම මේ කටයුතුවලට මහත් උපකාරයක් විය. ඇතැම්විට ඔවුහු එළිවනතුරු එක හුස්මටම වාගේ පරීක්ෂණාගාරයට වී නානාවිධ පර්යේෂණවල යෙදුණාහ. එසේ රැය මුළුල්ලේ වැඩ කෙරෙන අවස්ථාවක් වූ විට ජෝන් සිල්වා ඒ වැඩකරන ගමන් තේ, කෝපි ආදියද පිළියෙල කරන්නේය. ඒ අතින් ඔහු හොඳ ගෘහණියක වුවද පරදවනසුලු විය.

"ආ ජෝන්! ඔබේ තේ එක හරි පංකාදු නොවැ. ලොකු හෝටලේකින්වත් බැහැ, මෙහෙම රසට තේ එකක් ලබාගන්න," යයි මෙහෙම තැනදී අනිල් රණවීර සිය සහකාරයාට පවසා, තේ එකේ රසය වැඩි වේලාවක් ලබනු පිණිස එය ටික ටික කටගාන්නේය.

ජෝන් සිල්වා සිනාසී හිස පහත් කරගත් ගමන්, එක්කෝ මළමිනියක සියුම් නහර බේරාගෙන මස් වෙන්කරන්නේය. එසේත් නැත්නම් හදවතක් රැගෙන කුඩා නළයකට එක්කොට හුළං දෙමින් හිස ඒ මේ අතට නම නමා මේ හදවත වැඩකරන හැටි සොයන්නේය. එහෙත් ඔහු සිය ස්වාමියාට උත්තර නොදී සිටින්නේද නොවේ.

"අපි පිරිමි හදන දඩබ්බර තේ වගේ නොවෙයි සර්, ගැහැනු අතකින් හැදෙන තේ එක, ආ! ඒකෙ රස!"

ජෝන් සිල්වා තමාට ඒ කීවේ ඇනුම් පදයක් බව, කෙළේ විහිළුවක් බව, දොස්තර අනිල් රණවීර දන්නේය. තමා ළඟදී විවාහවෙන්නට යන බැවින් ජෝන් සිල්වා මේ කියන්නේ තමාගේ ප්‍රියාව වෙන්නට යන අනෝමා ගැන බව ඔහු එයින් වටහාගෙන, "හඃ හඃ හා මං දන්නවා, ඒ කීවේ මොකක්ද කියා ජෝන්," යයි හිස සල සලා පවසා, තෙමේද මහහඬින් සිනාසෙන්නේය.

www.musesbooks.com

Copyrighted Material



ජෝන් සිල්වා ඒ කීවේ ඇත්තකි. දොස්තර අනිල් රණවීර, අනෝමා ඒකනායක නම් රූමත් තරුණියක හා ආවාහවීමේ බලාපොරොත්තු ඇතිව සිටින්නේය. ඔහු මේ අනෝමා හා ඇසුරට වැටී දැන් අවුරුද්දකටද කිට්ටුය. තමා දැන් මේ කරගෙන යන වැදගත් පර්යේෂණ කටයුතු වගයක් නිසා ඔහු මේ විවාහය පවා පමා කරමින් සිටින්නේය. එහෙත් මේ පමාව එතරම් හොඳ නොවන බව අනෝමා නම් දන්නීය. සිය පියාණන් වූ ඒකනායක මුදලිතුමා මේ ආවාහයට කැමති වුවද, තම මව එතරම් මෙයට කැමැති නැති සැටිද අනෝමා දන්නීය. මවගේ බෑනා කෙනෙකු වූ ඇලෝසියස් කොරෙයා නමැති තරුණයකු මෙහාට යාම් ඊම් කිරීම එයට හේතු විය. මව, එනම් ඒකනායක මැතිනිය වඩා කැමැත්තක් දක්වන්නේ වතු හිමියකු වූද, මැරවර පාහේ කෙනෙකු වූද සිය ඥාතිවර ඇලෝසියස් කොරෙයාට මේ දියණිය ආවාහකර දීමටය.

ඇලෝසියස් කොරෙයාද ඔහේ ආවාට ගියාට අමතක කර දැමිය හැකි තරමේ පුද්ගලයෙක් නොවේ. මේ දොස්තර රණවීර මුදලට ගත හැකි බඩුවක් නම් මෙලාකටත් ඔහු අතින් එය කෙරිලා ඉවරය. ඔහුට එපමණටම මුදල් ඇත්තේය. පුළුවන් නම් එවැනි මිලදී ගැනීමක් කරන්නට තරම් සිතද ඇත්තේය. මේ ඒකනායක බූදලය සුළුපටු එකක් නොවන බවද, ඈ ඒ පවුලේ එකම දරුවා බැවින් අනෝමා බැඳගත් කෙනෙකුට මේ මහා බූදලය නිරායාසයෙන්ම අත්වන බවද ඇලෝසියස් කොරෙයා දන්නේය. එහෙත් මේ මඟුල කරගන්නට ඇති බාධාවන් කීපයක්ම ඔහු දැන් දකින්නේය. දොස්තර රණවීර එයින් ප්‍රධාන බාධාවය. මේ දොස්තර තැන මෙතැනින් ඉවත් කළ වහාම ඒකනායක වලව්වට පාර ඉබේම කැපෙන සැටිද, එතැනට ගිය කල සිය නැන්දණියගෙන් අනුබලය නොමඳව ලැබෙන සැටිද, ඒ ටික කෙරුණ කල අනෝමා නම් කොහොමටත් කැමැති කරවා ගත හැකි සැටිද ඇලෝසියස් කොරෙයාටද දැන් පෙනෙන්නේය. එහෙත් මේ එකක්වත් ලෙහෙසියෙන් කෙරෙන ඒවා නොවන බව පෙනුණ කල, ඔහු නොසන්සුන් විය. ඒ කොතරම් වීද යත්, හිඳගන්නා පුටුව පවා ඔහුට දැන් වදයක් මෙන් දැනෙන්නට පටන්ගෙන තිබේ. පුටුවේ හිඳගත් කලද ඔහු මේ ප්‍රශ්නයෙන් කැලඹෙන්නේය. නින්දට ගියද එයින් පීඩා විඳින්නේය. වැඩක යෙදුණද හිතේ එකලාසයක් ඇතිව එය කරන්නට මේ ප්‍රශ්නය ඔහුට ඉඩ නොදුන්නේය.

Copyrighted Material



ඇලෝසියස් කොරයා මෙසේ නොසන්සුන් බවෙන් යුතුව, තමා නිසා මේ තරමටම නළියන බව දොස්තර අනිල් රණවීර දන්නේ නැති. ඔහු මේ ළඟක පටන් මහා පුදුම පර්යේෂණයක යෙදෙනා බැවින් අනෝමා ගැන විනා ඇලෝසියස් කොරයා වැනි පිටස්තර අයකු ගැන හිතමින්, ඔහුගේ සිතැඟි ගැන කල්පනා කරමින් පසුවන්නට කාලයක් නැති. දහවල් කාලයේදී නැතිනම් සවස් කාලයේදී ඔහු අනෝමා දකින්නට ඉඳහිටලා යාම සිරිතය. අනික් වේලාවලදී ඔහු රෝගීන්ට වෙදකම් කිරීමෙහි යෙදෙන්නේය. රෑ වුණ වේලේ පටන් ජෝන් සිල්වා සමඟ පරීක්ෂණාගාරයට වී එක හුස්මටම වැඩ කරන්නේය.

ඔහු මේ ළඟදී සිට කරන පර්යේෂණය පුදුම එකකි. එය ඉතින් නිකමටවත් හරිගියොත් මුළු ලෝකයේම මහා පුදුම වෙනසක් ඇතිවන බව මේ වෛද්‍යවරයා නිසැකවම දන්නේය. මරණයේදී මිනිස් සිරුරට වන්නේ කුමක්ද, ක්‍රියාවිරහිත වන්නේ මොන ප්‍රධාන අවයවද, කෘත්‍රිම කොටස්වලින් මේ අවයව ක්‍රියාකරවන්නට බැරිද යන කරුණු ගැන ඔහු කලක සිට පරීක්ෂණ පවත්වන්නේය. එහෙත් මේ ශරීර කූඩුවට ආත්මය එකතු වන තැනේදී ඔහුගේ මොළය අවුල් වෙයි.

ශරීරයට ආත්මයත් සම්බන්ධ කාරණය නොවේ නම්, මෙලාකටත් දොස්තර රණවීර මරණය නවත්වලාය. ආත්ම ප්‍රශ්නය මෙතැනට මහා වදයක් බැවින් ඔහු දැන් මේ පර්යේෂණ පවත්වන්නේ ඒ ගැන අමතක කරමිනි. ඒ අමතක කළ තරමට, වෛද්‍ය විද්‍යාවට ගෝචර නොවන මේ සියුම් ප්‍රශ්නය ගැන නොසිතූ තරමට, ඔහුගේ පරීක්ෂණවල ප්‍රතිඵලද සතුටුදායක විය.

"ආ සිල්වා, මේ විදියට බලනකොට අපට පුළුවන් වේවි නේද, මේ වඳුරාව ආයෙත් මරලා පණ ගන්න. අපි හෙට මූව මරමු, ඔළුව පොඩිකරලා."

ජෝන් සිල්වා, දොස්තර රණවීර දෙස නෙත් නොපියා බලාසිටියා පමණි. ඔහු වරක් මේ වෛද්‍යවරයා දෙසද, තවත් වරක් මේසය මත වූ වඳුරු කූණ දෙසද බලා හිස සැලුවේය. ඔහුට දැන් දොස්තර ගැන දුක හිතෙනුවාට මේ වඳුරු ප්‍රාණය ගැන දුක් හිතන්නේය. දින කීපයකට පෙර වෛද්‍යවරයා මේ වඳුරාගේ පපුව පිහියකින් තුවාලකොට, නොහොත්, ඌට පිහියෙන් ඇන මරාදමා නැවත පණ දී ඇත්තේය. සති දෙකකට උඩදී, වඳුරාට ආහාර නොදී

Copyrighted Material



හාමත් කර මරා දමා, පැය තුනකට පසු යළිත් පණ ගත්තේය. දැන් උගේ කකුලක් කඩා දමා ඇත්තේය. ඒ කකුල කැඩීම නිසා ලේ වහනය වීමෙන් වඳුරා මැරී ඇතද, ලේ දීම, කැඩුණ කකුල සවිකිරීම ආදිය කොට, වායුව දී හදවත ක්‍රියාකරවා වඳුරා නැවත පණගන්වන්ට වෛද්‍යවරයා බලාපොරොත්තු වන්නේය. එයද සමහර විට හරියන්ට පුළුවන් බව සිතුණ කල ජෝන් සිල්වා හිස සලන්නට විය. ඒ අතර මේ සියලු තල්ලු හා නෙරෙක්කුම් විඳින අසරණ වඳුරා ගැනද ඔහුට කනගාටු සිතිණි.

"අනේ, මේ දුප්පත් වඳුරා! ඌ දැන් කී පාරක් මළාද?" ජෝන් සිල්වා එසේ කී කල, දොස්තර අනිල් රණවීර සිනාසුණේය.

"ඌ මැරුණ තරමට මට හොඳයි සිල්වා. මේ පර්යේෂණවල ප්‍රතිඵල දියුණු වුණ දාට මූට විශේෂ සංග්‍රහයක් කරනුවා, අපට උදව්වුණාට."

ජෝන් සිල්වා හිස සලා යළිත් තම කාර්යයෙහි නිරත විය. අනතුරුව එසේ බිම බලාගත් ගමන් සිට, පර්යේෂණාගාරයේ දොරට ගසන ශබ්දයකට කන් දුන්නේය.

"කවුද ඒ සිල්වා? බලන්න, කවුද කියා."

ජෝන් සිල්වා අත සෝදාගත්තේය. අනතුරුව මේ පර්යේෂණාගාරයේ කොනක වූ දොර වෙතට ගොස් එය විවෘත කෙළේය. එසේ කළ ඔහු කවදාවත් මෙතැනට නොආ අමුත්තකු දැක, සිය ස්වාමියා වූ දොස්තර රණවීර දෙස විස්මයෙන් බැලීය.

"සර්, අනෝමා පුංචි නෝනා ඇවිදින්."

එයින් දොස්තර රණවීර උඩ ගොස් වැටුණාක් මෙන් විය. විදුලියකින් ක්‍රියාකළාක් මෙන් ඔහුගේ හිස ඉබේම එසවිණි. අනතුරුව ඔහු ලේ තැවරුණු දෙඅතින් යුතුව ඉදිරියට ආවේය.

"සර්, අත්වැසුම්..."

එයින් දොස්තර තවත් කලබල විය. ඔහු අනෝමාට හිඳගන්නට පුටුවක් පෙන්වා, ජෝන් සිල්වාට පිට හරවා හිටගෙන, ලෙයින් තෙමුණු අත්වැසුම් ගලවන්නට විය. ඒ අතර ජෝන් සිල්වා, දොස්තර අනිල් රණවීර හැඳ සිටි සුදු ලෝගුවේ පිටුපස පටි ලිහන්නට විය.

පස් පියුමෙන් සැදි විලක් තරණය කරන හංස ධේනුවක මෙන් අනෝමා ඒකනායක පර්යේෂණාගාරයේ එහා කොන දක්වා ගොස් පුටුවක් මත වාඩිවිය. ඒ අතර වෛද්‍යවරයාද තවත් පුටුවක වාඩිවිය.

MusesBooks

Copyrighted Material



"ඔබ මොකද මේ අවේලාවේ? මොකටද ඔබ තනියම මේ ගමන ආවේ?"

අනෝමා සිය පෙම්වතාගේ මුහුණ බලා සිට, අනතුරුව සිනාසුණාය.

"මා තනියෙන් නොවේ ආවේ. සුවාරිස් අප්පු කාර් එකේ ඉන්නවා."

එයින් දොස්තර සැනසිල්ලට පත්වීය. මේ මහලු සේවක සුවාරිස් අප්පුට ඔහුද කැමැතිය. සුවාරිස් අප්පු, ඒකනායක මුදලිටත් වඩා මේ අනෝමාට ආදරය දක්වන කෙනෙකු බැවින්, ඈ දැන් මේ ඇවිත් සිටින්නේ ඉතාම සුදුසු ආරක්ෂකයෙකු සමඟ බව තීරණය කළ ඔහු ඒ ගැන තවත් ප්‍රශ්න ඇසුවේ නැති.

"ඉතින්?" යයි ඇසූ දොස්තර අනිල් රණවීර, සිය පෙම්වතියගේ හිස පටන් දෙපා දක්වා බැලීය.

"අර මනුස්සයා අම්මාව රවටාගෙන අනිල්. ඈ දැන් දෙපැත්තට වැනෙනවා."

දොස්තර අනිල් රණවීර සිනාසුණේය.

"ඔබ මේ මහ රෑ ආවේ ඒ බව කියන්නද අනෝමා?" යයි ඔහු විචාළේය.

"මං ආවේ ඒ නිසාම නොවෙයි. ඔබ දින තුනකින්ම එහෙ නොආ නිසයි. ඔබට මොකද මේ වෙලා තියෙන්නේ? මිනිස්සු රෑට නිදාගන්නේ නැද්ද?"

ඈ එකටෙක කිසිම සම්බන්ධයක් නැති ප්‍රශ්න කීපයක් මෙසේ විමසූ කල, දොස්තර අනිල් රණවීර කට කොනකින් සිනාසුණේය.

"අනෝමා, මේ දවස්වල මම ඉතා වැදගත් පරීක්ෂණ වගයක් පවත්වනවා. එය අතරමඟදී කඩා දමන්න හොඳ නැහැ. තව සතියක් ගතවුණාම සියල්ල ඉවරවේවි," යයි කී දොස්තර අනිල් රණවීර සිය පෙම්වතිය දෙස බලා, "මම මේ හෙට ඒ පැත්තේ එන්නටයි හිතා හිටියේ," යයිද පවසා වටපිට බැලුවේය.

"මේකේ මහා බේත් ගඳයි. එන්න ශාලාවට," යයි කී ඔහු අනතුරුව සිය සේවකයාට වැඩ කීපයක් පවරා, අනෝමා සමඟ එතැනින් පිටවිය.

# 2 පරිච්ඡේදය

කොළඹ කුරුඳුවත්තේ 'අනෝමා' නිවස, කා අතරත් නමගිය ස්ථානයකි. අනෝමාව වඩාත්ම ජනප්‍රියත්වයට පත්වුණේ, එයට අධිපති සයිමන් ඒකනායක මුදලිතුමා නිසාය. පරණ පෙළැන්තියට අයත් කෙනෙකු වුවද, ඒකනායක මුදලිතුමා පරණ ක්‍රම හා නොවුවමනා පරණ රස්නයට කොතෙකුත් ගරු නොකළේය. ඇත්ත වශයෙන් අවංකව රජයට කළ සේවය වෙනුවෙන් සයිමන් ඒකනායක මහතාට මුදලිකමක් ලැබුණද, එවැන්නක් නැතිව වුවත් ඔහුගේ හොඳ නම පතළ විය. මුදලිකම නිසා ඔහු බැබළුණාට වඩා ඔහු වැන්නන් නිසා මුදලිකම බැබළුණ බව බොහෝදෙනාගේ මතය විය. මුදලිඳු සයිමන් ඒකනායක එපමණටම හොඳ මිනිසකු විය.

ඔහු මුලින්ම කෙළේ, රජයේ කොන්ත්‍රාත් ගැනීමය. එකල රට පාලනය වුණේ ඉංගිරීසීන් අතින් බැවින් සයිමන් ඒකනායකයන්ට උසස් පෙළේ යුරෝපීයයන් රාශියකගේම ඇසුර ලැබිය හැකි විය. ඒ ඇසුර නිසා සයිමන් ඒකනායකයන්ට මෙන්ම ඔවුනටද නොයෙක් පහසුකම් ඇති විය. එමෙන්ම ඒ ඇසුර වැඩිවෙන්ට වෙන්ට මේ දූරදර්ශී කොන්ත්‍රාත්කරුවාගේ තත්වයද ඒ මේ කියන කලියෙන් උසස් විය.

මුදල් හදල් ලැබුණද සයිමන් ඒකනායක මහතා වෙනත් අය මෙන් ඒවා ගොඩගසන්ට පමණක් සිතුවේ නැති. ඔහුට එසේ මුදල් ගොඩගසන්ට තරම් දරු කැලතක්ද නොවීය. සියල්ලටම ඔහුට සිටියේ අනෝමා නම් මේ දියණිය පමණකි. ඈ වැනි හත් අට දෙනෙකු වුවද ජීවත්වන්නට, දීගයන්නට සෑහෙන තරම් ධනයක් 'අනෝමාවේ' තිබුණ බැවින්, සයිමන් ඒකනායක මුදලි නොවුවමනා කුම්මැහිකම් නොපැවැත්වීය. ඔහු රටේ නොයෙකුත් සාමාජික

Copyrighted Material



www.musesbooks.com

Copyrighted Material

# ප්‍රාරම්භය

ඔහු එදා සයනින් නැගිට්ටේ වෙනදාටත් කලින්ය. ඒ ඉරිදා දවසකි. එදාට ටිකක් යහමින් නිදාගැනීම කාගේත් සිරිත වුවද, සමන් ගුණවර්ධනට නම් එවැන්නක් අවශ්‍ය නොවීය. ඔහු පෙරදින නින්දට ගියේද රෑ බෝ වෙලාය. එහෙම රෑ බෝවී නිදාගත් දවසට ඔහු ටිකක් යහමින් නිදාගැනීම පුරුද්දක් වුවද, ඒ පුරුද්ද පවා අද ඔහුගෙන් කඩවී ඇත්තේය.

ඔහු යහනින් නැගිට තම කාමරයේ කවුළුවත් දොරත් දෙකම විවෘතකොට, එයින් ගෙතුළට ගලා ආ ශීත වාතය ඔනෑකමින් උරා, පපුව පුරවාගෙන සිගරැට්ටුවක් දල්වාගත්තේය. අනතුරුව සමන් ගුණවර්ධන කවුළුව ළඟටම වී එය උරන්නට විය.

විනාඩි දහයක් ගතවෙන්නට පෙර ඔහුගේ හිතවත් සේවක අදිරියන් සොල්දරයට නගින ශබ්දය ඇසිණි. ඔහු ආපසු හැරී දොරටුව දෙස බලන කලියෙන්, පුවත්පතද, කහට, සීනි, කිරි හා පීරිසි කුට්ටමෙන් යුත් තේ බන්දේසියද රැගත් මහලු අදිරියන් කාමරයේ දොරකඩ පෙනී සිටියේය.

"අද හරි ශීතලයි මහත්තයා. මහත්තයට හොඳ නැහැ, ඔය ජනේල ඇරගෙන ඉන්න. සීතල සුළඟ හෙම්බිරිස්සාවට අගුණයි."

අදිරියන් එසේ පවසමින් පුවත්පත මේසය මත තබා, තේ බන්දේසියද එහිම තැන්පත් කළේය.

සමන් ගුණවර්ධන, මහලු අදිරියන්ගේ උපදෙස ගැන එතරම් සැලකුවේ නැති. ඔහු බන්දේසිය දෙස බැලීය.

"මොකද අද කවදාවත් නැතිව කෝපි?"

මහලු අදිරියන්ට සිනහ පහළ විය.

www.musesbooks.com

Copyrighted Material



"අද පසළොස්වකනේ මහත්තයා. සෙලා අම්මා සිල් ගන්න ගියා. ඈ කෝපි හදාගෙන තියෙනවා කාටත් එක්ක."

"ඉතින්?"

"තේ හදාගෙන එන්නයි මං උන්නේ. කාමරයේ ලයිට් එක පත්තුවෙනවා දැකලා මම කෝපිම පිළියෙල කළා."

සමන් ගුණවර්ධන හිස සලා සිනහවක් පහළ කෙළේය.

"එහෙනම් සෙලා අම්මත් අද සිල් අරගෙන ආ! මොනවද ඉතින්, එතැන ගිහිල්ලත් ඕපදූපයි අනුන්ගේ ඇදකුදයි කියවාවි. ඊයේ මං බලාගෙන මල් වගයක් කඩන්න වත්තට ආපු පොඩි ගෑනු ළමයෙකුට ඔය ගෑනි ගැහැව්වා."

"ඒ ගෑනිගේ හැටි එහෙම තමා මහත්මයා. හරි නපුරුයි," යයි අදිරියන් කීය.

"නිකමට කල්පනා කරන්න එපායැ, මල් කඩන්නේ පූජා කරන්න බව. අර කෙල්ලගෙ කනින් මිරිකලා, පිටට පාර දෙක තුනක් ගැහැව්වා. මං මෙතන ඉඳලා කෑ නොගහන්න ඒ ළමයාට හොඳටම ගහනවා," යයි කී සමන් ගුණවර්ධන, එවර සිගරැට්ටුව අළු බඳුනේ කට්ටය මත තැන්පත් කර, කොප්පයකට කිරි වත්කරගෙන කෝපි එකක් පිළියෙල කරන්නට විය. ඒ අතර අදිරියන්, පෙරදින රෑ ගෙනෙන ලද තේ බන්දේසිය සහ කෝප්ප පීරිසි එකතු කරගෙන කාමරයෙන් පිටවිය.

සමන් ගුණවර්ධන එවර සැපපහසු පුටුවක වාඩිවී, කෝපි කෝප්පය ටික ටික බොමින් පත්‍රය දිගහැරියේය. එසේ පත්‍රය බලන ඔහුට දක්නට ලැබුණේද හිතට වදදෙන, තව තවත් තම හිත නොසන්සුන් කරන ප්‍රවෘත්තිමය. බම්බලපිටියේ මිනීමැරුමක් ගැන පුවතක් මුල් පිටේම විය. අප්‍රිකාවේ ළඟදී ස්වාධීනත්වය ලත් තවත් රටක කැරැල්ලක් ඇතිවී, එහි නායකයා මරාදමා රජය පෙරළා ඇති සැටි ඒ පිටේම තවත් තැනක විය.

පත්‍රයේ තව තවත් පිටු පෙරළන ඔහුට දක්නට ලැබුණේද එවැනිම පුවත්ය. අද පමණක් නොව කවදාටත් ඔහුට මේ පුවත්පත්වලින් පෙනෙන්නේ ලෝකයේ ඇති දුෂ්ටබවය. ඔහු එයින් තවත් කලකිරීමට පත්ව, මහා බර සුසුමක් හෙළා පත්‍රය පසෙක තැබීය.

ඔහුගේ මේ කලකිරිල්ල, නැතිනම් ළතැවිල්ල අද ඊයේ ඇතිවුණ එකක් නොවේ. තරමක් තේරෙන කාලයේ පටන් ඔහු

www.musesbooks.com

Copyrighted Material



මිනිසාගේ දුෂ්ටභාවය ගැන කලකිරී සිටින්නේය. සිය පියාණන්ගේ බලවත් ඇවිටිල්ල නිසා ඔහු ඉගෙනීම සඳහා පිටරට ගොස් විද්‍යාව පිළිබඳ උගෙන, නොයෙක් හපන්කම් කොට, නොයෙක් උපාධි ලබාගෙන දැන් මේ පෙරළා පැමිණ සිටියද, මිනිසාගේ දුෂ්ටත්වය පිළිබඳව එදා පටන් ඔහු තුළ ඇති කලකිරිල්ල නම් මඳකුදු අඩුවී නැති. යුරෝපයේදී ඔහුගේ මේ කලකිරිල්ල තවත් වැඩි විය. දැන් ඔහු සිය මව්බිමට ආපසු විත් දෙවසකි. ඒ දෙවස තුළ මිනිසා වෙනුවෙන් ඔහුගේ ඇති මේ පුදුම කලකිරිල්ල තවත් වැඩිවී ඇත්තේය.

සමන් ගුණවර්ධන දැන් තිස් වියේ සිටින තරුණයෙකි. රැකියාවක් නොකළද, පරම්පරාවක් මුළුල්ලේ වුවද වියදම් කරන්නට සෑහෙන මුදලක් ඔහුගේ පියාගෙන් දැන් ඉතිරි වී ඇත්තේය. පාලනය කරන්නට වැඩිහිටියෙක් නැති බැවින්, වෙන තරුණයෙකුට නම් ඕනෑපදම් නරක්වෙන්ට මේ ධනය හා නිදහස හොඳටම ඇත. එහෙත් සමන් ගුණවර්ධන එවැනි මඟක් දෙස කිසි විටෙකත් නොබැලීය.

එක අතකින් බලන කල ඔහු විද්‍යාඥයකු වන්නට උපන් කෙනෙකු නොවේ. ඒ පිළිබඳ ඔහුගේ දැනීම, පර්යේෂණවලින් ලත් අත්දැකීම පුදුමාකාර වුවද දැන් පවා කවුරුත් කියන්නේ සමන් ගුණවර්ධන ඉපදී ඇත්තේ මහණකමට බවය. එය ඇත්තකි. ඔහු නිකමටවත් අඩියක් ගහන්නේ නැති. වරදකට ගන්නවා නම් ඔහුගෙන් කෙරෙන එකම වැරැද්ද මේ සිගරැට් බීම පමණි.

පෙරදින සවස මේ මහා මන්දිරයේ මුළුතැන්ගෙය භාර සෙලා අම්මා මල් කඩන්නට ආ දැරියට පහර කීපයක් ගැසූ වේලේ පටන්, මිනිසා පිළිබඳව ඔහු තුළ සැඟවී ඇති කලකිරිල්ල ඇවිස්සී ඇත්තේය. දැන් සෙලා අම්මා සිල්ගන්නට ගොස්ය. පෙරදින සවස ඈ දැක්වූ දරුණුබවේත්, දැන් මේ සිල්ගැනීම පිළිබඳ ඇගේ චේතනාවේත් වෙනස කෙතරම්ද? ඒ අතින් බලන කල, සෙලා අම්මා තුළ රෝපණය වී ඇත්තේ දුෂ්ටත්වය පමණක්ද?

මේ ඔහුගේ හිතට වද දෙමින් කාලාන්තරයක් මුළුල්ලේම ඔහු තුළ නළියන ප්‍රශ්නයක් තමා. මිනිසා තුළ හොඳ නරක දෙකම ඇති බව ඔහු දන්නේය. එහෙත් දුර්ගුණයම මතුවන පරිදි මිනිහා එන්ට එන්ට දරුණුවීම, ඔහුට විසඳාගත නොහැකි පැනයකි. පුවත්පතක් බැලුවත්, ගුවන්විදුලියට කන් දුන්නත්, වෙන ආරංචියක් ඇසුවත් ඔහු තුළ සිදුවන්නේ මේ ප්‍රශ්නය තව තවත් ශක්තිමත් වීම පමණි.

MusesBooks®

Copyrighted Material



දැන් ඉතින් මේ පත්‍රයෙන්ද කියැවෙන්නේ ඔහු තුළ බුර බුරා දැවෙන මේ පටලැවිල්ලටම තුඩුදෙන දේවල්මය. ඔහු එයින් තවත් කලකිරීමට පත්ව පත්‍රය පසෙක දමා, දෙඅත්ල හිස පිටුපසට තබාගෙන අත්පුටුවේ හාන්සි වුණේය. එහිදී අදිරියන් යළිත් කාමරයට ඇතුළු විය.

"මහත්මයා..."

එයින් සමන් ගුණවර්ධන තිගැස්සී ආපසු බැලුවේය. එසේ බලන ඔහුට පෙනුණේ සිනහා මුහුණින් සිටින තම හිතවත් සේවකයාය. ඇත්ත වශයෙන්ම මේ අදිරියන්ද ඔහුටම කැපෙන, ජාඩියට මූඩිය බඳු කෙනෙකි. අදිරියන් දැන් හැටපස් වියේ සිටින්නේය. එහෙත් බැලූ බැල්මට ඔහුට එතරම් වයසක් නොපෙනේ. කොණ්ඩය පැසී ඇතද අදිරියන්ගේ ඇඟපත ශක්තිමත්ය. තවමත් ඔහු ඉද්ද ගැසුවාක් මෙන් කෙළින් ඉන්නේය.

අදිරියන් සර්වප්‍රකාරයෙන් මේ සමන් ගුණවර්ධනටම කැපෙන මිනිහෙකි. දෙදෙනාගේම අදහස් උදහස් එකම බැවින් ඔවුන් අතර වාදයක් හටගන්නේ කලාතුරකිනි. එසේ ඉතින් ඉඳහිටලා නුමුත් වාදයක් ඇතිවුණත් එය කෙළවර වෙන්නේ යහතිනි. ඔවුන් දෙදෙනා ඒ තරමටම සමාන අදහස්වලින් යුක්තය. මේ සමන් ගුණවර්ධන මෙන්ම අදිරියන්ද කිසිවිටෙකත් මත්පැන් නොගන්නේය. මස් මාංශ නොගන්නේය. සමන් ගුණවර්ධන දුම් ඉරීම කළද, අදිරියන් අතින් එයවත් කෙරෙන්නේ නැති.

තම ස්වාමියාගේ ප්‍රබල තැන් මෙන් දුබල තැන්ද අදිරියන් හොඳහැටි දන්නේය. මිනිසා තුළ පවත්නා දුර්ගුණ සම්බන්ධයෙන් තම තරුණ හාම්පුතා තුළ පවත්නා බලවත් කලකිරිල්ල ගැනද ඔහු හොඳහැටි දන්නේය. මිනිසා සුමගට යැවීම සඳහා මේ තරුණයා උදේ සිට සවස් වන තුරු කතා කළද, එය කවදාවත් නොකෙරෙන එකක් බවද මේ වයෝවෘද්ධ අදිරියන් දකින්නේය.

"මහත්මයා මොකද කල්පනා කරගත් ගමන්?" යයි අදිරියන් සිය ස්වාමියාගේ මුහුණ එක එල්ලේ බලා ප්‍රශ්න කෙළේය.

සමන් ගුණවර්ධන හිස ඔසවා, තලත්තානියකු මෙන් අදිරියන්ගේ මුහුණ බැලීය.

"නෑ, මං මේ කල්පනා කළේ..."

"මිනිස්සුන්ගේ දරුණුකම ගැනයි," යනුවෙන් අදිරියන් සමන් ගුණවර්ධන කියන්නටත් පෙර පවසා යළිත් සිනාමුසු විය.

Copyrighted Material



"බලන්න මේ පත්තරේ. හැමපිටකම තියෙන්නේ විනාශකාරී ප්‍රවෘත්ති. මිනීමැරුම්, හොරකම්, ස්ත්‍රී දූෂණ, ආණ්ඩු පෙරළීම් කෙළවරක් නැහැ."

අදිරියන් හිස සලමින් එය අනුමත කෙළේය.

"ලෝකේ හැටි ඔහොම තමා මහත්මයා. අපට ඒවා නවත්වන්න බැහැ."

එයින් සමන් ගුණවර්ධන කිපුණේය. වෙන කෙනෙකුගෙන් නම් මෙවැන්නක් කියැවුණේ, එය ඔහුට එක් අතකින් ඉවසිය හැක. එහෙත් ලෝකයා ගැන කොතෙකුත් දොස් කියන, තමාගේ අදහස් නිතරම අනුමත කරන මේ අදිරියන්ගෙන් එවැන්නක් පළවීම ගැන ඔහු අප්‍රසාදයට පත්විය.

"ඇයි එහෙම කියන්නේ අදිරියන්? මිනිහා දවසින් දවස හොඳ වෙන්න එපායැ? මොළය වැඩෙන්න වැඩෙන්න හොඳ වියයුතු මිනිහා, දැන් බලාගෙන යනකොට දවසින් දවස දරුණු වෙනවා. මට නම් මේක මහා පුදුමයක්. මොකද මිනිහා මේ තරම් දරුණු?"

මේ ඉතින් ඔහුගෙන් කොතෙකුත් ඇසෙන ප්‍රශ්නයක් තමා. සිය දහස් වාරයකටත් වඩා ඔහු අදිරියන්ගෙන් මේ ප්‍රශ්නය අසා ඇත්තේය. එහෙත් එයට සතුටුදායක පිළිතුරක් දෙන කිසිම කෙනෙක් ඔහුට එතෙක් මෙතෙක් හමුවෙලා නැති.

"අපට බැරිද මේකට යමක් කරන්න අදිරියන්?" යයි ඇසූ සමන් ගුණවර්ධන, සිය හිතවත් සේවකයාගේ මුහුණ එක එල්ලේම බැලුවේය.

අදිරියන් ලොකු හුස්මක් ඇද යළිත් පහළට දමමින්, හිස දෙපසට සැලීය.

"බුදුහාමුදුරුවන් වහන්සේ කළෙත් ඕකම තමා," යයි පවසා, අදිරියන් හිස ඇලකරගෙන දෙනෙත් අඩවන් කරගත්තේය.

"මොකක්ද?"

"උන්වහන්සේ කළෙත් මිනිසුන් සුමගට යැවීම නොවැ? යේසුස් වහන්සේ කුරුසියේ දිවි පිදුවේත් ඒකටයි. මහම්මත්තුමා සතුරු බිය මැද්දේ සටන් කළේත් ඕකටයි."

සමන් ගුණවර්ධන සිගරැට්ටුව රැගෙන උගුරක් ඉරුවේය.

"නුමුත් කෝ ලෝකයේ මේ අපරාධ අඩුවුණා? එක් අතකින් බලනකොට ඉස්සර ලෝකය හොඳයිනේ අදිරියන්. අපි පොඩි දවස්වල මේ තරම් ලෝකෙ හොරමැරකම් තිබුණේ නැහැ. දැන් දැන් ඒවා වැඩියි. ඉතින් මොකක්ද මේ ආගම්වලින් වෙච්ච වැඩේ?"

MUSESBOOKS®

www.musesbooks.com

Copyrighted Material



අදිරියන් නළල රැලිගස්වා, තමන්ට හුරු වූ බර බැල්මෙන් සමන් ගුණවර්ධන දෙස බැලීය.

"හා! හා! එහෙම කියන්න එපා මහත්මයා. බුදුහාමුදුරුවන් වහන්සේගෙන් ලෝකයට ලොකු සේවයක් වුණා."

"මම නැහැ කියන්නේ නෑ අදිරියන්. උන්වහන්සේගෙන් ඉතා ශ්‍රේෂ්ඨ සේවයක් වුණා තමා. මං කියන්නේ අපට එයින්වත් බැරිවුණානේ සෑහෙන ප්‍රයෝජනයක් ගන්න."

"ඒක බුදුහාමුදුරුවන්ගේවත්, ධර්මයේවත් වරදක් නොවෙයි. අපේ වැරැද්ද!"

සමන් ගුණවර්ධන මහා හඬින් සිනාසුණේය.

"ඒක තමා මමත් කියන්නේ, මොකක්ද මේ වැරැද්ද? කවුද මේ වැරැද්ද කරන්නේ?"

"මිනිහාම නොවැ."

සමන් ගුණවර්ධන ගල්ගැසුණාක් මෙන් මහලු අදිරියන් දෙස බලාගත්වනම සිට අසුනෙන් නැගිට්ටේය.

"අදිරියන්, උඹෙන් ඒ කියැවුණේ වැදගත් කාරණයක්. මට නම් ඒකෙ තියෙනවා, කල්පනා කරන්ට කොතෙකුත් දේවල්."

අදිරියන් හිස දෙපසට සැලුවේය. එහෙත් යමක් නොකීවේය.

"අදිරියන්, මිනිහාම තමා හොඳ කරන්නේත්. ඔහුම තමා දරුණු වැඩ කරන්නේත්. දැන් බලමු, සෙලා අම්මා. ඈ අද සිල් ගත්තා. නුමුත් ඊයේ හවස යස්සනියක් වාගේ අර ගෑනු ළමයට කඩාපැන්නා."

"ඒක තමා මහත්මයා මිනිස් ස්වභාව."

අදිරියන් එසේ පවසා, තරුණයා දෙස බලාගත්වනම සිටියේය.

"මිනිස් ස්වභාව," යයි එයම උච්චාරණය කළ සමන් ගුණවර්ධන, "මිනිස් ස්වභාවේ හැටි තමා එක වෙලාවක හොඳවීමත්, එක වෙලාවක නරක වීමත්," යයි පවසා, "ඇයි අපට බැරි හොඳින්ම ඉන්න අදිරියන්, නරක අත්ඇරලා?" යනුවෙන් ඇසීය.

අදිරියන්ගේ මුහුණේ සිනා රැල්ලක් නැගිණි. "එහෙම වෙනවා නම් කොච්චර හොඳද මහත්තයා. ලෝකය එහෙනම් ජීවත්වන්ට ඉතාම හොඳ තැනක් වේවි."

සමන් ගුණවර්ධන කටුස්සෙක් මෙන් හිස සලන්නට විය. "ඒක තමා මං කියන්නෙත් අදිරියන්. මේ මිනිස්සු මේ විදියට වැරදි වැඩ නොකර ඒවා අයින්ම කරලා දානවා නම්, ඊළඟට ඔවුන්ගෙන්

www.musesbooks.com

Copyrighted Material



කෙරෙනතාක් කෙරෙන්නේ හොඳ ටික පමණයි. හා! හා! එහෙම ලෝකයක අපට කවදාවත් ජීවත්වෙන්න ලැබෙන එකක් නැහැ," යයි කී සමන් ගුණවර්ධන, යළිත් කවුළුව ළඟට වී ඈත පෙනෙන නගරශාලා ගොඩනැගිල්ලේ දිලිසෙන කොන දෙස බලාගත්වනම සිටියේය.

MusesBooks®